සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**තෙවන වාර පරීක්ෂණය - 2020**
**Third Term Test - 2020**

| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය** Grade 11 | **නාට්‍ය හා රංග කලාව - I** | **පැය එකයි** One hour |

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.

---

- පහත දැක්වෙන පද්‍ය පාඨ ඇසුරෙන් ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - වැඩපල කළේ තැනුවේ අඹුවත් එක්ක
හැඩ බල බලා තැළුවේ දාගෙන ඔක්ක
මඩගුලි ගෙනත් පෙරළා ඉඳගෙන වක්ක
බඩහැල මලේ අරගෙන පලයන් බොක්ක

B - යස ඉසුරු පිරුණු තැනා - සිරි දෙව් දූ සිටින තැනා
ලගම ඇතේ දුරක නැතේ - අපි යන්නේ ඒ පාරේ

C - යුනිවර්සිටි එකයි ඇත්තේ
මෙඩිකල් ෆැකල්ටි එකයි ඇත්තේ
අපි ඔක්කෝම හැටක් ඇත්තේ
ෆැකල්ටියට පහයි ගත්තේ

D - දන්න වංහුං අප කන්නසාමි රාජ දූරයේ...
රාජ දූර රාජ දූර රාජදූරයේ.......

E - ඉඳින් බබෝ ඉඳින් - මගේ අතේ ඉඳින්
බෝ ආදරෙන් නුඹේ මව්මෙන් - රකින්නෙමි මෙ මං

F - ගම්බිර මහ නිරිඳු සමග උතුමන් වැඩමවන බැවින
සුන්දර උඩු වියන් දමල වට තිර පාවඩා එළන

01. නූතන නාට්‍ය ගීතයක් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
(i) A ය. (ii) C ය. (iii) D ය. (iv) F ය.

02. නූර්ති නාට්‍ය ගීතයක් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
(i) B ය. (ii) C ය. (iii) D ය. (iv) E ය.

03. E අක්ෂරය සඳහන් පද්‍ය කොටස
(i) නූර්ති ගායනයකි. (ii) නව නාට්‍ය ගායනයකි.
(iii) කෝලම් නාට්‍ය ගායනයකි. (iv) නාඩගම් නාට්‍ය ගායනයකි.

04. කෝලම් නාට්‍ය ගායනයක් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
(i) A ය. (ii) B ය. (iii) E ය. (iv) F ය.

05. කොහොඹාකංකාරි ශාන්තිකර්මය හා බැඳෙන පද්‍ය පාඨය අයත් ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
(i) A ය. (ii) D ය. (iii) F ය. (iv) E ය.

06. නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,

(i) අසා රසවිඳීමේ හැකියාව. (ii) යටි පෙලක් තිබීම.

(iii) සිද්ධි මාලාවක් අනුපිළිවෙලින් තිබීම. (iv) තනිව රස විඳිය හැකි වීම.

07. ''ලෝකයේ පැවැත්ම අනුකරණය කර පෙන්වීම''

(i) ඇරිස්ටෝටල්ගේ ප්‍රකාශයකි. (ii) ධනංජයගේ ප්‍රකාශයකි.

(iii) භරතමුණිගේ ප්‍රකාශයකි. (iv) අභිනව ගුප්තගේ ප්‍රකාශයකි.

08. දෘෂ්‍ය කලා මාධ්‍යයන් පමණක් අඩංගු ගොනුව වන්නේ,

(i) චිත්‍ර, මූර්ති, කැටයම් (ii) මූර්ති, ඔපෙරා, කාටූන්

(iii) කැටයම්, චිත්‍ර, චිත්‍රපට (iv) ඡායාරූප, මුද්‍රා නාට්‍ය, කාටූන්

09. නාට්‍ය කලාව තුළ අන්තර්ගත නොවන කලාවක් වන්නේ,

(i) මූර්ති කලාව (ii) සිනමා කලාව (iii) චිත්‍ර කලාව (iv) නර්තන කලාව

10. සක්‍රීය ප්‍රේක්ෂක සහභාගීත්වයක් නොපැවතිය හැක්කේ,

(i) නාට්‍ය කලාවේ ය. (ii) සංගීත කලාවේ ය.

(iii) නර්තන කලාවේ ය. (iv) ටෙලි නාට්‍ය කලාවේ ය.

11. නෘත්තාංග ද්වයක් සඳහා උදාහරණ වන්නේ,

(i) භරත නාට්‍යයම්, තෙල්මේ නැටුම් (ii) ලී කෙලි නැටුම්, පා සරඹ

(iii) කලගෙඩි නැටුම්, ශිව පාර්වති (iv) ගොඩ සරඹ, වඩිග පටුන

12. අතීත රංගභූමියක් සහ නූතන රංග භූමියක් සඳහන්ව ඇත්තේ.....

(i) කමත - ආරුක්කු වේදිකාව (ii) පූජා භූමිය - කරළිය

(iii) වට රවුම් වේදිකාව - ප්‍රොසීනියම් වේදිකාව (iv) අර්ධ කවාකාර රංග භූමිය - පින්තූර රාමු වේදිකාව

13. නිශ්චිත (ගණිතමය) රටාවකට අනුව බෙදා වෙන් කළ ක්‍රමයකට අනුව කරනු ලබන චලනය ......

(i) රිද්මයානුකූල චලනයයි. (ii) තාත්වික චලනයයි.

(iii) පරිකල්පනීය චලනයයි. (iv) තාලානුකූල චලනයයි.

14. නාට්‍යමය අවස්ථාවක තිබිය නොහැකි ලක්ෂණයක් වන්නේ,

(i) ගැටුමයි. (ii) කුතුහලයයි. (iii) තේමාවයි. (iv) දෙගිඩියාවයි.

15. ආ .......... ර, ස, ල වැනි ශබ්ද පිටවන අයුරින් හුස්ම පිට කිරීම,

(i) ස්වසන අභ්‍යාසයයකි. (ii) කටහඬ අභ්‍යාසයකි.

(iii) මානසික ඒකාග්‍රතා අභ්‍යාසයකි. (iv) ශිථිලකරණ අභ්‍යාසයකි.

16. සංවේදන රංග අභ්‍යාසයක් සඳහා උදාරණයක් වන්නේ,

(i) සෙමින් හුස්ම ගැනීම - වේගයෙන් පිට කිරීම.

(ii) හිසෙහි සිට පාදාන්තය දක්වා ශරීරාංග ලිහිල් කිරීම.

(iii) මී මෝ .... මී වෝ.... නම් අභ්‍යාසය කිරීම.

(iv) දෑස් වසාගෙනතමා අවට ඇසෙන හඬවල් වලට අවධානය දීම.

17. නාට්‍ය පෙළක දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ,

(i) රංග විධාන හා සංවාද වලින් යුක්ත වීම.

(ii) රංග රචනයකින් සහ සංගීත රචනයකින් යුක්ත වීම.

(iii) කිසියම් සිද්ධියකින් හෝ අවස්ථාවකින් යුක්ත වීම.

(iv) තර්කානුකූල සිද්ධි පෙළ ගැස්වීමකින් යුක්ත වීම.

18. රංගාලෝක පහනක් නොවන්නේ,

(i) ධාරාලෝක පහනය. (ii) යොමු පහනය.

(iii) වර්ණ චක්‍රය ය. (iv) ආලෝක බුබුළු වැටය.

19. රංගාලෝකයෙන් ඉටුනොවන කාර්යයක් වන්නේ,

(i) පරිසරය හුවා දැක්වීම.

(ii) අවස්ථා තීව්‍ර කිරීමය.

(iii) එක් අයෙකු හෝ ස්ථානයක් විශේෂ කර පෙන්වීමය.

(iv) නළු නිළියන් ලස්සන කර පෙන්වීමය.

20. වේෂ භූෂණය,

(i) නළුවාගේ රූපණ කාර්ය ප්‍රබල කරයි. (ii) සාත්ත්වික අභිනය පහසු කරයි.

(iii) චරිත සමාරෝපයට ඉවහල් වේ. (iv) නළුවාගේ සුන්දරත්වය වැඩි කරයි.

21. රංග රචනය ලෙස සැලකෙන්නේ

(i) නළු නිළි චලනයන් තාලානුකූලව හෝ රිද්මයානුකූලව පෙළ ගැස්වීමයි.

(ii) නළු නිළි සංචලන ආනුෂාංගික අංග වලට අදාළ සේ සංයෝජනය.

(iii) වේදිකා භූගෝලයට අනුව නළු නිළියන් ස්ථානගත කිරීම.

(iv) නර්තනානුකූලව නළු නිළි චලන පුහුණු කිරීම.

22. රංග භූමි අලංකරණය ........

(i) නොමැතිව ද නාට්‍යයක් ඉදිරිපත් කළ හැකිය.

(ii) නොමැතිව නාට්‍යයක් ඉදිරිපත් කළ නොහැකිය.

(iii) නාට්‍යයකට අත්‍යාවශ්‍ය වේ.

(iv) සඳහා චිත්‍රවස්ත්‍ර හෝ යොදාගත යුතුය.

23. නාට්‍ය ප්‍රේක්ෂකයාගේ කාර්යභාරය නොවන්නේ,

(i) විචාරය කිරීමයි. (ii) නිර්මාණ කිරීමයි.

(iii) රසවින්දනය කිරීමයි. (iv) විනිශ්චය කිරීමයි.

24. වැරදි සම්බන්ධතාවය තෝරන්න.

(i) හෙළ ගැඹුරුයි පුත නොබලන් - වැල් පාලම

(ii) දී කිරි දී කිරි - රතු හැට්ටකාරි

(iii) මූදු පතුල යට ඉඳලා - මූදු පුත්තු

(iv) කඩේට පලයං වැචුං - තාරාවෝ ඉගිලෙති

25. රංගෝපකරණ පමණක් සඳහන් ගොනුව වන්නේ,

(i) මේසය, පුටුව, ජනේලය (ii) හෙල්ල, දොර, කුඩය

(iii) පැන් කෙණ්ඩිය, කඩුව, හැරමිටිය (iv) පොරව, ගස, ඇඳ

26. ශෛලිගත සම්ප්‍රදයෙන් දෛනික ජීවන ප්‍රශ්න නාට්‍යයට නැංවීමය සාර්ථකව ජය ගත්තේ,

(i) හෙන්රි ජයසේන ජනේලය නාට්‍යයෙන් ය.

(ii) සයිමන් නවගත්තේගම පුස්ලෝඩං නාට්‍යයෙන් ය.

(iii) බන්දුල ජයවර්ධන ස්වරණපාලි නාට්‍යයෙහි ය.

(iv) ඩග්ලස් රණසිංහ හොටබරි යුද්දේ නාට්‍යයෙන් ය.

27. ශ්‍රී ලංකීය ලෝකධර්මී නාට්‍ය නිර්මාණයේ ප්‍රමුඛයා වන්නේ,

(i) හෙන්රි ජයසේන ය. (ii) සුගතපාල ද සිල්වා ය.

(iii) බන්ධුල ජයවර්ධන ය. (iv) ඩග්ලස් රණසිංහ ය.

28. පරාක්‍රම නිරිඇල්ල නාට්‍යකරුවා සුවිශේෂී වන්නේ,

(i) ජාතික නාට්‍ය උළෙලේ අවස්ථා කිහිපයක දීම සම්මානයට පාත්‍රවීම නිසා ය.

(ii) පරිවර්තන, අනුවර්තන, ස්වතන්ත්‍ර නාට්‍ය රැසක් නිර්මාණය කළ නිසාය.

(iii) චිත්‍රපට, ටෙලිනාට්‍ය, සහ වේදිකා නාට්‍ය යන අංශවල සිය නිර්මාණාත්මක දායකත්වය ඇතිවීම නිසාය.

(iv) ජන කරළිය ජංගම රඟමඩල මගින් ලංකාවේ සම්මත රංග ක්‍රමය වෙනස් කිරීම නිසාය.

29. සිනමා, ටෙලි නාට්‍ය හා වේදිකා නාට්‍ය ත්‍රිත්වයේ ම කැපී පෙනෙන ලෙස හාස්‍ය රංගනයේ යෙදුනේ,

(i) ශ්‍රියන්ත මෙන්ඩිස්ය. (ii) විජය නන්දසිරි ය.

(iii) විජයරත්න වරකාගොඩ ය. (iv) ජැක්සන් ඇන්තනීය.

30. ගායන හා රංගන කුසලතාවයෙන් ප්‍රකට තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ රඟපෑ රංගන ශිල්පිනිය වන්නේ,

(i) මානෙල් ජයසේන ය. (ii) චන්ද්‍රනී සෙනෙවිරත්න ය.

(iii) අනුලා බුලත්සිංහල ය. (iv) මැණිකේ අත්තනායක ය.

- **පහත දැක්වෙන වගුව ඇසුරෙන් ප්‍රශ්න අංක 31 - 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තන/අනුවර්තන නම | පරිවර්තකයා/අනුවර්තකයා |
|---|---|---|---|
| ද කැට් ඔෆ් අ හොට් ටින් රූෆ් | A | B | සුගතපාල ද සිල්වා |
| C | එව්ගිනි ෂ්වාන්ස් | D | සිරිල් සී පෙරේරා |
| ඉක්නෙටුටා ඉ | E | බෙර හඬ | F |
| G | H | මඟුල් ප්‍රස්ථාව | යූ. ඒ. ගුණසේකර |

31. "A" කොටුවේ ඇතුළත් විය යුතු නම,
    (i) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය. (ii) ටෙනසි විලියම් ය.
    (iii) ගාර්ෂියා ලෝකා ය. (iv) ලුයිජි පිරැන්ඩෙලෝ ය.
32. ඇන්ටන් චෙකොෆ්ගේ නම ඇතුළත් විය යුත්තේ,
    (i) A කොටුවේ ය. (ii) E කොටුවේ ය. (iii) F කොටුවේ ය. (iv) H කොටුවේ ය.
33. "D" කොටුවේ ඇතුළත් විය යුතු නම,
    (i) චෙරි වත්ත ය. (ii) මරාසාද් ය. (iii) හරිම බඩුහයක් ය. (iv) මකර රාක්ෂ ය.
34. "E" කොටුවේ දැක්වෙන නාට්‍ය රචකයා,
    (i) ග්‍රීක ජාතිකයෙකි. (ii) ඉංග්‍රීසි ජාතිකයෙකි.
    (iii) රෝම ජාතිකයෙකි. (iv) ඇමෙරිකන් ජාතිකයෙකි.
35. "F" කොටුවේ ඇතුළත් විය යුතු නම,
    (i) හෙන්රි ජයසේන ය. (ii) ඇන්ටන් චෙකොෆ් ය.
    (iii) බන්ධුල ජයවර්ධන ය. (iv) එදිරිවීර සරච්චන්ද්‍ර ය.
36. දක්ෂිණ භාරතීය කර්නාටක සංගීතයේ හා උත්තරභාරතීය සංගීතයේ ආභාසය ලබාගෙන ඇත්තේ,
    (i) ටවර්හෝල් නාට්‍ය සහ ටීටර් නාට්‍ය ය. (ii) නූර්ති නාට්‍ය සහ මිනර්වා නාට්‍ය ය.
    (iii) නාඩගම් නාට්‍ය සහ නූර්ති නාට්‍ය ය. (iv) ටීටර් නාට්‍ය සහ මිනර්වා නාට්‍ය ය.
37. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (i) 1923 දී පිහිටුවාගත් විශ්ව විද්‍යාලයේ සිංහල සමිතිය මගින් ද ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනය කරන්නට විය.
    (ii) විශ්ව විද්‍යාල ඉංග්‍රීසි නාට්‍ය සංගමයේ නාට්‍ය නිර්මාණ රැසක්ම එදිරිවීර සරච්චන්ද්‍ර අතින් සිදුවිය.
    (iii) විශ්ව විද්‍යාල ඉංග්‍රීසි නාට්‍ය සංගමයේ නාට්‍ය නිෂ්පාදනය සඳහා මූලික වූයේ ඊ. එෆ්. සී ලුඩෝවයික් ය.
    (iv) විශ්ව විද්‍යාල පාදක කොටගෙන මිනර්වා සහ ටීටර් නාට්‍ය විශාල ප්‍රමාණයක් බිහි විය.

- **අංක 38 - 40 දක්වා ප්‍රශ්න සඳහා ඡායාරූප ඇසුරු කරගන්න.**




38. B ඡායාරූපයේ දැක්වෙන නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා වන්නේ,
    (i) ගුණසේන ගලප්පත්ති ය. (ii) රොඩ්නි වර්ණකුල ය.
    (iii) ජයලත් මනෝරත්න ය. (iv) දයානන්ද ගුණවර්ධන ය.
39. E ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
    (i) ජය කෝලම ය. (ii) අණබෙර කෝලම ය.
    (iii) පොලිස් කෝලම ය. (iv) හේවා කෝලම ය.
40. A සහ D ඡායාරූපයෙන් පිළිවෙලින් දැක්වන්නේ,
    (i) වීදි රංගනයක් සහ බැලේ රංගනයකි.
    (ii) ශාන්තිකර්ම රංගනයක් සහ නූතන නාට්‍ය රංගනයකි.
    (iii) අභිරූපනයක් සහ මුද්‍රා නාට්‍ය රංගනයකි.
    (iv) නෘත්ත රංගනයක් සහ ඔපෙරා රංගනයකි.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

**11 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව - II** | **පැය දෙකයි**
Grade 11 | | Two hours

උපදෙස් :
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) පහත පද්‍ය සංවාද කොටස කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

'' සත් අවුරුද්දක් මෙහෙකර - ගත්තු මගේ අඹු සිඟිත්ත
සමග අවේ ගමට යන්න මං
මගෙ හාමුදුරුවෝ සමග ආවේ ගමට යන්න මං
මේ හොර දිගාටුවා - ගඟ ගැඹුරුයි කියලා
මහගජ බින්න දොඩාලා
මගෙ අඹුත් රැගෙන පලා යන්න ගියේ මේ හොරා''

(i) මෙම කොටස ගායනා කරන චරිතය නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙහි හොරා යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමන චරිතය ද? (ලකුණු 02)

(iii) මහගජ බින්න, මෙහෙකර යන වචනවල අදහස සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ කාට ද? (ලකුණු 02)

(v) එම චරිතය මෙම නාට්‍යයේ සිදුකරන සුවිශේෂී කාර්යය කුමක් ද? (ලකුණු 02)

(vi) මෙම නාට්‍ය ශෛලියේ මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(02) (i) පහත රට ප්‍රදේශයට ආවේණික ශාන්තිකර්ම 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) එම ශාන්ති කර්මවල දැකිය හැකි නාට්‍යමය පෙළපාලි 02 ක බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) තෝරාගත් එක් ශාන්තිකර්මයක විරාම රංග අවස්ථාවක ඇති නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) රූපණය යන්න හඳුවන්න. (ලකුණු 03)

(ii) රූපණය හා බැඳන අනුෂාංගික අංග 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) රූපණ කාර්යයේ දී අවධානය යොමු කළ යුතු කරුණු 04 ක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) ප්‍රධාන අංග රචනා ප්‍රභේද දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) අංග රචනය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අංග රචනයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු 03 ක් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ප්‍රාසාංගික කලාව යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රසාංගික කලාවන් 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාසාංගික කලාවන් හි දැකිය හැකි මූලික ලක්ෂණ 03 ක් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) ශ්‍රී ලංකාවේ පැරණිතම ජන නාට්‍ය පැවැත්වීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඒක ජන නාට්‍යයේ විශේෂ ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) එම ජන නාට්‍යයෙන් ඉදිරිපත් වන කතා පුවත සාරංශ කොට දක්වන්න. (ලකුණු 05)

(07) ''අතපත්තු මහතා තම මිදුලේ ඇති මල්ගස් වලට වතුර වත්කරමින් සිටින විට එකවරම යාන්තමට විවිරව තිබූ ගේට්ටුවෙන් සිහින් සිරුරක් සහිත තරුණයෙක් පැමිණියේ ය. අත් දිග කමිසයක් ඇඳ ටයිපටියක් ද පැළඳ සිටි ඔහු අත නිවසක භාවිතයට ගන්නා කුඩා ඉලෙක්ට්‍රික් භාණ්ඩ කිහිපයක් විය... මුඛ අවාරණයක් ද පැළඳ නොසිටි මෙම තරුණයා අතපත්තු මහතා අසලට පැමිණ ඉලෙක්ට්‍රික් භාණ්ඩ සහිත බෑගය ඔහු ලගින්ම තැබුවේ ය....''

මෙතැන් සිට සිදු වූ දේ පිළිබඳ ඔබ විසින් පරිකල්පනය කොට කෙටි නාට්‍යයක් රචනා කරන්න.

(i) පසුබිම, කාලය, රංග විධාන, සංවාද සහිතව පිටපත රචනා කිරීමට (ලකුණු 04)

(ii) නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි කතා පුවත නිර්මාණය කිරීමට (ලකුණු 08)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 - (ii) | 11 - (ii) | 21 - (i) | 31 - (ii) |
| 2 - (iii) | 12 - (i) | 22 - (i) | 32 - (iv) |
| 3 - (iv) | 13 - (iv) | 23 - (ii) | 33 - (iv) |
| 4 - (iv) | 14 - (iii) | 24 - (i) | 34 - (i) |
| 5 - (i) | 15 - (i) | 25 - (iii) | 35 - (iii) |
| 6 - (ii) | 16 - (iv) | 26 - (i) | 36 - (iii) |
| 7 - (iii) | 17 - (ii) | 27 - (ii) | 37 - (iii) |
| 8 - (i) | 18 - (iii) | 28 - (iv) | 38 - (iv) |
| 9 - (ii) | 19 - (iv) | 29 - (ii) | 39 - (ii) |
| 10 - (iv) | 20 - (iii) | 30 - (iii) | 40 - (iii) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

(01) (i) කාලගෝල

(ii) දික්පිටියා

(iii) මහගජ බින්න = විශාල බොරුවක් / ලොකු බොරුවක්
මෙහෙකර = මෙහෙකාර සේවය / වැඩකාරකම

(iv) මහෞෂධ පඬිතුමාට

(v) කාලගෝල, දික්පිටියා හා දික්තලා අතර ඇති වූ ගැටළුව විසඳීම / නඩු වියඳීම.

(vi)
- ⋆ පද්‍යමය සංවාද පැවතීම. (නාට්‍ය ධර්මී සංවාද)
- ⋆ පොතේ ගුරෙක් සහ ගායක කණ්ඩායමක් යොදා ගැනීම.
- ⋆ නාඩගම් නාට්‍යවල දැකිය හැකි බහුබූත කෝලම නම් ස්ථාවර පත්‍රයා යොදා ගැනීම.
- ⋆ ගමන් තාල යොදා ගැනීම.
- ⋆ වේදිකා පසුතල භාවිතා නොකිරීම.
- ⋆ පූර්ව රංගනයක් යොදා ගැනීම.
- ⋆ මංගලම් සිංදුව ගායනා කර නාට්‍ය අවසාන කිරීම. යනාදි වශයෙන් පවතින ලක්‍ෂණ සඳහන් කර තිබීම සලකා බලන්න.

(02) (i) රටයකුම, දහඅට සන්නිය, සූනියම් ශාන්තිය

(ii) (i) හි සඳහන් ශාන්ති කර්මවල නාට්‍යමය පෙළපාලි 02 ක බැගින් නම් කර තිබීම.

(iii) එම ශාන්තිකර්මවල පවතින නාට්‍යමය පෙළපාලි / විරාමරංග වලින් එකක් පිළිබඳ විස්තර කිරීම. නාට්‍යමය ලක්‍ෂණ සඳහන් කිරීම සහ විරාම රංගයේ ස්වභාවය පැහැදිලි කිරීම සලකා ලකුණු ලබා දෙන්න.

(03) (i) ''චරිතයකට ආරෝපණය වී කිසියම් කාලසීමාවක් එහි ජීවත් වීම''
යන අදහස මත පරිදි කරන පැහැදිලි කිරීම සලකා බලන්න.

(ii) අංග රචනය, වේෂ භූෂණය, රංගාලෝකය, රංග අලංකරණය, සංගීතය

(iii)
- ⋆ චරිතයේ කායික ස්වභාවය.
- ⋆ මානසික ස්වභාවය.
- ⋆ චරිතය මෙසේ හැසිරීමට හේතු
- ⋆ වචන භාවිතයට හේතු
- ⋆ චරිතයේ වයස
- ⋆ ස්ත්‍රී පුරුෂ භාවය
- ⋆ සංස්කෘතිය / යුගය / කාලය
- ⋆ නාට්‍ය පිටපත

(04) (i)
- ★ සරල අංග රචනය
- ★ චරිතාංග අංග රචනය

(ii)
- ★ අංග රචනය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය 04 ක් ලියා තිබීම.
(උපකරණ ලියා තිබේ නම් ලකුණු ලබා නොදෙන්න.)

(iii)
- ★ චරිතයේ ස්භාවය (මිනිස්, සත්ව, මනඃකල්පිත)
- ★ ස්ත්‍රී පුරුෂ භාවය
- ★ සමෙහි වර්ණය
- ★ නාට්‍යයේ ශෛලිය
- ★ නාට්‍යයෙන් නිරූපිත කාලය, දේශය, යුගය
- ★ අනෙකුත් අනුෂාංගික අංග
- ★ නාට්‍ය අධක්ෂකවරයාගේ අවශ්‍යතාවය.

(05) (i)
- ★ ''ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ ජීවතමානව ඉදිරිපත් කරනු ලබන කලාව'' ප්‍රාසාංගික කලාව වේ.''
- ★ ''ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන ශිල්පියා ගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් රංග භූමියක කෙරෙන නිරූපණ කලාව.''

(ii) නර්තනය, සංගීතය, නාට්‍ය, මුද්‍රා නාට්‍ය, බැලේ නාට්‍ය, ඔපෙරා නාට්‍ය ගීත නාට්‍ය

(iii)
- ★ සජීවී බව
- ★ අභිනය භාවිතය
- ★ ඍජු ප්‍රේක්ෂක සහභාගීත්වය
- ★ රංග භූමියක් භාවිතා කිරීම.
- ★ විනෝදාස්වාදය මූලික වීම.

(06) (i)
- ★ විනෝදාස්වාදය
- ★ සශ්‍රීකත්වය හා සෞභාග්‍යය
- ★ පලදාව ලබා ගැනීම.

(ii)
- ★ අනුරූපනය යොදා ගැනීම (අභිරූපනයෙන්)
- ★ කමත රංගභූමිය කොට ගැනීම.
- ★ ඇතැම් පාත්‍රයන් වෙස් මුහුණු පැළඳීම.
- ★ නාට්‍යධර්මී ලක්ෂණ වලින් යුක්ත වීම.
- ★ සියළුම චරිත පිරිමින් විසින් රඟපෑම.
- ★ එකම කතාවක් රඟදැක්වීම.
- ★ පොතේ ගුරෙක් සහ ගායක කණ්ඩායමක් යොදා ගැනීම.

(iii) සොකරි සම්බන්ධ මූලික කතා පුවත කෙටියෙන් ලියා තිබීම. (11 වසර ගුරු අත්පොතේ සඳහන්ව ඇති හෝ ඊට සමාන කතා පුවත ලියා තිබීම සලකා බලන්න.)

(07) (i) රංග විධාන, සංවාද සහ කථාවේ පසුබිම කාලය හැඟවෙන පරිදි පිටපත රචනා කර තිබීම. රංග විධාන සහ සංවාද සම්මත නාට්‍ය පිටපතක් සේ ලියා තිබීම. සලකා උපරිම ලකුණු 04 යි.

(ii) නටෝචිත අවස්ථාවක් ගොඩනැගෙන සේ චරිත අතර ඝට්ටනය ගොඩනැගී අර්ථවත් අවස්ථාවක් නිරූපණය වන සේ නාට්‍ය පෙළ රචනය සිදු වී තිබේ නම් (ලකුණු 08 යි)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍ර සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371




Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## කෙටි සටහන් පොත්










මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

